ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No.    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2026.4.20

පැමිණිලි පාර්ශවය : 01. ටී.ඒ. එස්. ද සිල්වා මයා

02. බී.එම්.කේ.වී. බණ්ඩාර මයා

03. කේ.එම්.ජී. බණ්ඩාරනායක මයා

04. ඒ.එම්.එස්.එන්. අතපත්තු මයා,

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය,

අංක 321/1,

මාකුඹුර,

පන්නිපිටිය.

වගඋත්තර පාර්ශවය : 01. සභාපති,

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය,

අංක 321/1,

මාකුඹුර,

පන්නිපිටිය.

02. අධ්‍යක්ෂ ජනරාල්,

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය,

අංක 321/1,

මාකුඹුර,

පන්නිපිටිය.

<u>**පැමිණිලි අංකය : HRC/2363/25**</u>


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04. / இல. 14, ஆர். ஏ. த. மெல் மாவத்தை, கொழும்பு 04. / No. 14, R. A. De Mel Mawatha, Colombo 04.
සභාපති / தவிசாளர் / Chairman: 011 - 250 5451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 250 5541/74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrcsl@gmail.com
දුරකථනය / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011 - 250 5521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**පැමිණිලිකරුවන්ගේ පැමිණිල්ල:**

පැමිණිලිකාර පාර්ශවය 2025.07.31 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් පහත කරුණු ඉදිරිපත් කර සිටී.

1. පැමිණිලිකාර ටී.ඒ.එස්. ද සිල්වා මහතා ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ කළමනාකරණ සහකාර තනතුර සඳහා 2020.10.06 දින සිට තාවකාලික පදනමින් සේවයට බඳවා ගෙන ඇති අතර, මාස 6 බැගින් අවස්ථා 3කදී සේවා කාලය දීර්ඝ කර ඇත. පසුව 2021.12.20 දින සිට ස්ථිර පත්වීම් ලිපියක් ලබා දී ඇත.

2. පැමිණිලිකාර ඒ.එම්.එස්.එන්. අතපත්තු මහතා ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ කළමනාකරණ සහකාර තනතුර සඳහා 2020.03.02 දින සිට තාවකාලික පදනමින් සේවයට බඳවා ගෙන ඇති අතර, මාස 6 බැගින් අවස්ථා 4කදී සේවා කාලය දීර්ඝ කර ඇත. පසුව 2021.12.20 දින සිට ස්ථිර පත්වීම් ලිපියක් ලබා දී ඇත.

3. පැමිණිලිකාර කේ.එම්.ජී. බණ්ඩාරනායක මහතා ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ කාර්යාල කාර්යය සහයක තනතුර සඳහා 2020.03.02 දින සිට තාවකාලික පදනමින් සේවයට බඳවා ගෙන ඇති අතර, මාස 6 බැගින් අවස්ථා 4කදී සේවා කාලය දීර්ඝ කර ඇත. පසුව 2022.01.13 දින සිට ස්ථිර පත්වීම් ලිපියක් ලබා දී ඇත.

4. පැමිණිලිකාර බී.එම්.කේ.වී. බණ්ඩාර මහතා ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ රියදුරු තනතුර සඳහා 2020.03.02 දින සිට තාවකාලික පදනමින් සේවයට බඳවා ගෙන ඇති අතර, මාස 6 බැගින් අවස්ථා 4කදී සේවා කාලය දීර්ඝ කර ඇත. පසුව 2021.12.20 දින සිට ස්ථිර පත්වීම් ලිපියක් ලබා දී ඇත.

ඉහත පැමිණිලිකරුවන් සියලුදෙනා සඳහන් කර සිටින්නේ, එකී ස්ථිර පත්වීම් ලිපිය ලබාදුන් නමුත් වසර 3ක පරිවාස කාලය ඉක්මවීමෙන් අනතුරුව තනතුරේ ස්ථිර කිරීමේ ලිපිය ලබා නොදුන් බවත්, කාර්යක්ෂමතා කඩයිම් විභාග සඳහා පෙනී සිටිමට අවස්ථාව ලබා නොදුන් බවත්, වැටුප් වර්ධක සහ 2024 වර්ෂයේ අයවැය තීරණ යටතේ ලබාදුන් දීමනා ද ඔවුන්ට මේ දක්වා ලබා දී නොමැති බවත් ය.

අදාළ පත්වීම් ලිපිය ලැබූ අවස්ථාවේදී කිසිදු ගැටළුසහගත තත්ත්වයක් සම්බන්ධයෙන් ඔවුන් දැනුවත්ව නොසිටි බවත්, ඒ අනුව පත්වීම ස්ථිර කිරීමට අවශ්‍ය කටයුතු කර දෙන ලෙසත්, රැකියාවේ සුරක්ෂිතභාවය ආරක්ෂා කර දෙන ලෙසත් ඉල්ලා පැමිණිලිකරුවන් විසින් මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම:**

වගඋත්තර පාර්ශවය විසින් 2025.09.22 දිනැති අංක 02/02/02/HR-HE දරණ වාර්තාව කොමිෂන් සභාව වෙත යොමු කරමින් පහත කරුණු ඉදිරිපත් කර ඇත.

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය 2007 අංක 26 දරන පාර්ලිමේන්තු පනත මඟින් ස්ථාපිත ආයතනයක් වන අතර, මෙහි ආයතනික පරිපාලනය සහ කළමනාකරණය විෂයභාර රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් 09 දෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් විසින් ඉටු කරනු ලබයි.

2020 වර්ෂයේ මෙම ආයතනයේ හිටපු සභාපතිවරයා වන ජයම්පති බණ්ඩාර හීන්කෙන්ද මහතා විසින් එවකට විෂය භාර අමාත්‍යවරයා වූ ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා වෙත ලිපියක් යොමු කරමින්, දඹුල්ල නගරයේ භාෂා ඉගැන්වීම සඳහා ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය සහ එයට අවශ්‍ය මානව සම්පත් ලෙස මධ්‍යස්ථාන භාර නිලධාරි - 01, සම්බන්ධීකරණ කළමනාකරණ සහකාර - 02, කාර්යාල කාර්ය සහායක - 02, රියදුරු - 02 ලෙස නව තනතුරු 07ක් බඳවා ගැනීමේ අවශ්‍යතාවය පෙන්වා දී ඇත.

ඒ අනුව, එම ලිපියට පිළිතුරු ලෙස එවකට සිටි විෂයභාර අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා ඔහුගේ අංක MPHL/MOF/SACHI/PM/2020 සහ 2020.02.27 දිනැති ලිපිය මඟින් යෝජිත දඹුල්ල නව පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කිරීම පිළිබඳව සිය එකඟත්වය පළ කර ඇත.

ඉන් අනතුරුව, එවකට නව නිලධාරීන් බඳවා ගැනීම සඳහා ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව (Approved Carder) තුළ පුරප්පාඩු නොමැති වූ බැවින්, ඒ සඳහා තාවකාලික පදනම මත නව තනතුරු 04ක් සඳහා බඳවා ගැනීමට හිටපු සභාපතිවරයා විසින් තීරණය කර, එය අනුමත කර ඇත.

ආයතනයේ පැවැති කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන් දඹුල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය සඳහා ප්‍රධාන කාර්යාලයේ සිටි නිලධාරින්ගේ සේවය පූර්ණ කාලීනව එම ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ රාජකාරි කටයුතු සඳහා යෙදවීමේ අපහසුතාවයක් තිබී ඇති අතර, ඒ සඳහා තාවකාලික පදනමින් බඳවා ගන්නා ලද පහත නම් සඳහන් අයගේ සේවය 2020.09.01 දිනෙන් අවසන් වූ නමුත්, නැවත එම අය 2020.09.07 දින සිට ඉදිරියට මාස 06ක කාල සීමාවක් සඳහා සේවයේ යෙදවීමට හිටපු සභාපතිවරයා අනුමැතිය ලබා දී ඇත.

1. ඒ. එම්. එස්. එන්. අතපත්තු මයා - කළමනාකරණ සහකාර
2. එච්. ආර්.ඩබ්ලිව්.ඩබලිව්. බී. එම්. ආර්. ටී. පී.ඩබ්ලිව්. එම්. බී. පී. බී. තැන්නේ මයා -කළමනාකරණ සහකාර
3. බී. ඉන්දික ප්‍රසන්න බණ්ඩාර මයා - කාර්යාල කාර්යය සහායක
4. බී. එම්. කළන විදුරංග බණ්ඩාර මයා - රියදුරු

ඉහත තාවකාලික පදනමින් බඳවා ගන්නා ලද බී. ඉන්දික ප්‍රසන්න බණ්ඩාර මහතා 2020.09.27 වැනි දින ද එම්. බී.පී.බී. තැන්නේ මහතා 2023.12.31 දින ද සේවයෙන් ඉල්ලා අස්වී ඇත.

2021.07.15 දින පැවැති 138 වන කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී හිටපු අධ්‍යක්ෂ ජනරාල් ප්‍රසාත් ආර්. හේරත් මහතා විසින් හිටපු සභාපති ජයම්පති බණ්ඩාර හීන්කෙන්ද මහතාගේ අනුමැතියට යටත්ව පහත සඳහන් අය තාවකාලික පදනමින් බඳවා ගැනීමට කටයුතු කර ඇත.

1. ටී. එස්. ශාන්ත ද සිල්වා මයා - කළමනාකරණ සහකාර
2. බී. ජී. පී. කුමාරි මිය - කළමනාකරණ සහකාර
3. පී.ඩබ්ලිව්.ඩී.ඩී. තිලකරත්න මයා - කළමනාකරණ සහකාර

ඉහත තිදෙනාගෙන් ටී. එස්. ශාන්ත ද සිල්වා යන අය හැර අනෙක් දෙදෙනා මේ වන විට සේවයෙන් ඉවත්ව ගොස් ඇත.

තවද 2021.11.11 දින පැවැති 138 වන කළමනාකරණ මණ්ඩල රැස්වීමට හිටපු අධ්‍යක්ෂ ජනරාල් ප්‍රසාත් ආර්. හේරත් මහතා විසින් "කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ 02/2020 චක්‍රලේඛය අනුව කලින් අනුමත කරගත් තනතුරු වල පුරප්පාඩු සඳහා නැවත එම දෙපාර්තමේන්තුවේ අනුමැතිය අවශ්‍ය නොවන බව දන්වා ඇත" යනුවෙන් සඳහන් කර, පහත සඳහන් අය ස්ථිර පදනම මත ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය වෙත බඳවා ගැනීමට කළමනාකරණ මණ්ඩල අනුමැතිය ඉල්ලා ඇත. මෙහිදී කළමනාකරණ මණ්ඩලයේ තීරණය වී ඇත්තේ අදාළ තනතුරු වලට බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලබා ගන්නා ලෙසය.

1. එස්. රොෂාන් සී. ද සේරම් මිය - සම්බන්ධීකරණ සහකාර
2. බී. ප්‍රදීපා දිලංජනී පෙරේරා මිය - සම්බන්ධීකරණ සහකාර
3. කේ. එච්.ජී. බණ්ඩාරනායක මයා - කාර්යාලීය කාර්ය සහායක

ඉහත නම් සඳහන් අයගෙන් දැනට කේ. එච්. ජී. බණ්ඩාරනායක මයා (කා.කා.ස) පමණක් තවදුරටත් සේවයේ නියුතුව සිටී.

2022.02.17 දින පැවැති 139 වන කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී තාවකාලිකව බඳවා ගත් අයගේ සේවය ස්ථිර කිරීමේදී බඳවා ගැනීමේ පටිපාටියට අනුව කටයුතු කරන ලෙසද, පුවත්පත් දැන්වීම්/අන්තර්ජාලයේ බඳවා ගැනීමේ දැන්වීම් පළ කර, විධිමත් ක්‍රමවේදයකට අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් අදාල සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීමට කටයුතු කරන ලෙසද කළමනාකරණ මණ්ඩලය විසින් හිටපු අධ්‍යක්ෂ ජනරාල් ප්‍රසාත් ආර්. හේරත් මහතාට දන්වා ඇත.

එහෙත්, කළමනාකරණ මණ්ඩලයේ උපදෙස්වලට පටහැනිව කටයුතු කරමින් දඹුල්ල ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයට තාවකාලික පදනමින් බඳවා ගන්නා ලද නිලධරයන්ට හිටපු සභාපතිවරයා විසින් සිය ධූර කාලය නිමා වීමට ප්‍රථම, විධිමත් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියෙන් බැහැරව සිය අත්සනින් යුතුව ස්ථිර පත්වීම් ලිපි ප්‍රදානය කර ඇත. එය සිය ධූරය සතු බලය අභිබවා කටයුතු කිරීමක් වන අතර එසේ පත්වීම් ලබාදීම පිළිබඳව ඊට පසුව හෝ කළමනාකරණ මණ්ඩලය දැනුවත් කර නොමැත.

2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනතේ 9 (3) (ඇ) වගන්තිය අනුව, කළමනාකරණ මණ්ඩලයේ විධානයන්ට යටත්ව ආයතනයේ කාර්ය මණ්ඩලයේ පත් කිරීම් සහ විනය පාලනය පිළිබඳ වගකිවයුතු වන්නේ අධ්‍යක්ෂ ජනරාල්වරයාය. අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා වන අතර, ඔහු විසින් ආයතනයට විධිමත් අයුරින් බඳවා ගනු ලබන නිලධරයන්ට පත්වීම් ලිපි නිකුත් කළ යුතු වන්නේය. එසේ නොවන පත්වීම් බල රහිත වන්නේය.

හිටපු සභාපතිවරයා විසින් විධිමත් ක්‍රියා පටිපාටියෙන් බැහැරව තම බලය අයුතු ලෙස යොදා ගනිමින් සිදු කරන ලද මෙම අත්තනෝමතික ක්‍රියාව හේතුවෙන් මහා භාණ්ඩාගාරයේ වැටුප් ගෙවීමේ හැකියාව මෙම නිලධරයන්ට නොලැබී ඇති අතර, ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය විසින් උපයනු ලබන ආදායමින් මෙම නිලධරයන්ගේ වැටුප් පාරිශ්‍රමික ගෙවීම සිදු කරනු ලැබ ඇත.

මෙසේ හිටපු සභාපතිවරයා විසින් අවිධිමත් ආකාරයට නිලධරයන් මෙම ආයතනයට බඳවා ගැනීම සහ ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම පිළිබඳව 2023 වර්ෂයේදී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන

කොමිෂන් සභාව විසින් විමර්ශනයක් සිදු කිරීම ආරම්භ කර ඇති නමුත්, එම විමර්ශනයේ ප්‍රතිඵල, නිගමන හෝ නිර්දේශ මෙතෙක් ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය වෙත ලැබී නොමැත.

2020 වර්ෂයේදී ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ දඹුල්ල ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයට බඳවාගත් නිලධරයන්ගෙන් ආයතනය තුළ තවදුරටත් රැඳී සිටින්නේ 2025.07.31 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කළ පහත නම් සඳහන් නිලධරයන් හතරදෙනා (04) පමණි.

1. ටී. ඒ.එස්. ද සිල්වා මයා - කළමනාකරණ සහකාර (2020.10.06 දින සිට)
2. ඒ.එම්.එස්. එන්. අතපත්තු මයා - කළමනා කරණ සහකාර (2020.03.02 දින සිට)
3. කේ.එම්.ජී. බණ්ඩාරනායක මයා - කාර්යාල කාර්ය සහායක (2020.03.02 දින සිට)
4. බී. එම්. කළණ විදුරංග බණ්ඩාර මයා - රියදුරු (2020.03.02 දින සිට)

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කර ඇති සේවක සංඛ්‍යාව 41 දෙනෙකි. එම අනුමත සේවක සංඛ්‍යාවෙන් දැනට නිත්‍ය තනතුරුවල සේවයේ රැඳී සිටිනුයේ 34 දෙනෙක් වන අතර, ඒ අනුව සේවක පුරප්පාඩු 07 ක් දැනට පවතී.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත සේවක සංඛ්‍යාවට පරිබාහිරව දඹුල්ල ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයට සේවකයන් බඳවා ගෙන ඇති අතර, ඒ අනුව ඉහත නම් සඳහන් කළ අය බඳවා ගැනීමට අවශ්‍ය අනුමැතිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන නොමැත.

සමස්ථ රාජ්‍ය අංශයේ නිලධරයන්ට ද්විභාෂා ප්‍රවීණතාවය ලබාදීම සඳහා සිංහල සහ දෙමළ භාෂා පුහුණු පාඨමාලා පැවැත්වීම, සම්බන්ධීකරණය කිරීම, පාඨමාලා විෂය නිර්දේශ සංවර්ධනය කිරීම මෙන්ම ඉංග්‍රීසි හා විදේශ භාෂා ඉගැන්වීම සඳහා පාඨමාලා පැවැත්වීම වැනි පුළුල් වැඩ කොටසක් සිදුකිරීම සඳහා මෙම ආයතනය වෙත වගකීම් පැවරී ඇති නමුත් ඒ සඳහා ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් මෙම ආයතනය තුළ නොමැති වීම විශාල ගැටළුවක් වන බවත්, එම මානව සම්පත් හිඟය යම්තාක් දුරට හෝ සමනය කර ගැනීමට මෙම අවිධිමත්ව බඳවා ගන්නා නිලධරයන් 04 දෙනාගෙන් ලැබෙන දායකත්වය අතිමහත් වන බවත් දක්වා ඇත.

2020 වර්ෂයේ සිට මෙම අවිධිමත්ව බඳවා ගනු ලැබූ නිලධරයන් 04 දෙනා ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයට සිය දැනුම, කුසලතාවය උපරිම අයුරින් ලබා දී ඇති අතර, එම තනතුරු සඳහා

අවශ්‍ය මූලික සුදුසුකම් මෙම නිලධරයන් සතුව ඇත. එමෙන්ම, 2020 වර්ෂයේ සිට ආයතනය විසින් උපයනු ලබන ආදායම් මඟින් මෙම නිලධරයන් සඳහා වැටුප්, EPF, ETF සහ අනෙකුත් දීමනා ගෙවා ඇත. එහෙත්, රජය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ විධිවිධානයන්ට අනුව, රජයේ ස්ථිර සේවක සංඛ්‍යාව (Approved Carder) සඳහා පමණක් ගෙවීමට නියෝග කර ඇති දීමනා සහ අනෙකුත් සහන මෙම නිලධරයන්ට ගෙවීමේ හැකියාවක් නොමැති බවට කරුණු ඉදිරිපත් කර ඇත. (උදා :- 2025 වර්ෂයේ සිට වැඩි කරන ලද වැටුප් සහ එයට අදාල අතිකාල දීමනා)

වර්තමානයේ දඹුල්ල නගරයේ ප්‍රාදේශීය කාර්යාලයක් මෙම ආයතනය විසින් පවත්වා ගෙන යනු නොලබන අතර, ආයතනයේ බහුතරයක් පාඨමාලා මාර්ගගත (online) ක්‍රමයට සිදු කරන බැවින් කළමනාකරණ මණ්ඩල තීරණයක් අනුව 2024 මැයි මාසයේදී දඹුල්ල ප්‍රාදේශීය කාර්යාලය වසා දමා එහි සේවය කල නිලධාරීන් මාකුඹුර පිහිටි ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත කර ඇත.

ඉහත කරුණු සියල්ලම සලකා බලා, කිසියම් නිශ්චිත අධිකාරි බලය සහිත රාජ්‍ය ආයතනයකින් මෙම නිලධරයන් 04දෙනා ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ ස්ථිර සේවක සංඛ්‍යාව ලෙස බඳවා ගැනීමට නිර්දේශ, අනුමැතිය හෝ නියෝග ලබා දෙන්නේ නම් එකී තොරතුරු කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර මෙම නිලධාරීන්ගේ ඉල්ලීම පිළිබඳව ඉදිරි කටයුතු සිදුකල හැකි බව වගඋත්තර පාර්ශවය විසින් වැඩිදුරටත් දන්වා ඇත.

<u>පරීක්ෂණයේදී සහ ඉන් අනතුරුව දෙපාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශන මඟින් අනාවරණය වන කරුණු</u>

මෙම පැමිණිල්ලට අදාළ පරීක්ෂණ කටයුතු 2025.09.02 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී දෙපාර්ශවයේ සහභාගීත්වයෙන් යුතුව සිදුකරන ලදී.

එහිදී වගඋත්තරකාර ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ සභාපති වෙනුවෙන් පෙනී සිටි සහකාර අධ්‍යක්ෂ ගයාන් සම්පත් පොතුපිටිය මහතා විසින් සඳහන් කර සිටියේ, ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව එක් එක් පැමිණිලිකරුගේ තනතුරට අදාළව සපුරාලිය යුතු සුදුසුකම් මෙම පැමිණිලිකරුවන් සපුරා ඇති බවත්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිර්දේශයක් ලබා දෙන්නේ නම්, එය කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, මෙම පැමිණිලිකරුවන් සිව්දෙනා ස්ථිර කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් සලකා බැලීමේ හැකියාවක් පවතින බවත් ය.

<u>නිරීක්ෂණ</u>

1. 2020 වර්ෂයේදී ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ සභාපතිවරයා වූ ජයම්පති බණ්ඩාර හීන්කෙන්ද මහතා විසින් එවකට විෂය භාර අමාත්‍යවරයා වූ ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා වෙත ලිපියක් යොමු කරමින්, දඹුල්ල නගරයේ භාෂා ඉගැන්වීම සඳහා ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දී විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාවය පරිදි දඹුල්ල නව පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කර ඇත.

2. එවකට නව නිලධාරීන් බඳවා ගැනීම සඳහා ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පුරප්පාඩු නොවූ බැවින් ඒ සඳහා තාවකාලික පදනම මත නව තනතුරු සඳහා බඳවා ගැනීම සිදුකර ඇති අතර, එලෙස බඳවා ගත් සේවකයන් අතරින් සිව්දෙනෙක් පමණක් මේ දක්වා ආයතනයේ සේවයේ යෙදී සිටී. එම සේවකයන් සිව්දෙනා මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇති පැමිණිලිකරුවන් වන අතර ඔවුන්ගේ නම් සහ තනතුරු නාම පහත පරිදි වේ.

   - ටී. ඒ. ශාන්ත ද සිල්වා මයා - කළමනාකරණ සහකාර
   - ඒ.එම්.එස්. එන්. අතපත්තු මයා - කළමනා කරණ සහකාර
   - කේ.එම්.ජී. බණ්ඩාරනායක මයා - කාර්යාල කාර්ය සහායක
   - බී. එම්. කළණ විදුරංග බණ්ඩාර මයා - රියදුරු

3. මෙම පැමිණිලිකරුවන් සිව්දෙනා ස්ථිර කාර්ය මණ්ඩලයට ඇතුළත් කිරීම සම්බන්ධයෙන් 2021.11.11 දින පැවැති ආයතනයේ කළමනාකරණ මණ්ඩල රැස්වීමට යොමු කළ අවස්ථාවේදී, කළමනාකරණ මණ්ඩලයේ තීරණය වී ඇත්තේ අදාළ තනතුරුවලට බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමටයි. කෙසේනමුත් පරීක්ෂණය අවස්ථාවේදී ඉදිරිපත් වූ කරුණුවලට අනුව කළමනාකරණ මණ්ඩලයේ තීරණය පරිදි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමක් සිදුව නොමැති අතර, 2022.02.17 දින පැවැති කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී තාවකාලිකව බඳවා ගත් අයගේ සේවය ස්ථිර කිරීමේදී බඳවා ගැනීමේ පටිපාටියට අනුව කටයුතු කරන ලෙසත්, පුවත්පත් දැන්වීම්/අන්තර්ජාලයේ බඳවා ගැනීමේ දැන්වීම් පළ කර, විධිමත් ක්‍රමවේදයකට අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් අදාළ සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීමට කටයුතු කරන ලෙසත් කළමනාකරණ මණ්ඩලය විසින් හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දන්වා ඇත.

4. එහෙත්, කළමනාකරණ මණ්ඩලයේ උපදෙස්වලට පටහැනිව කටයුතු කරමින් දඹුල්ල ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයට තාවකාලික පදනමින් බඳවා ගන්නා ලද නිලධරයන්ට හිටපු සභාපතිවරයා විසින් සිය ධූර කාලය නිමා වීමට ප්‍රථම, විධිමත් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියෙන් බැහැරව සිය අත්සනින් යුතුව ස්ථිර පත්වීම් ලිපි ප්‍රදානය කර ඇත.

5. 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනතේ 9 (3) (ඇ) වගන්තිය අනුව, කළමනාකරණ මණ්ඩලයේ විධානයන්ට යටත්ව ආයතනයේ කාර්ය මණ්ඩලයේ පත් කිරීම් සහ විනය පාලනය පිළිබඳ වගකිවයුතු වන්නේ අධ්‍යක්ෂ ජනරාල්වරයාය. අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා වන අතර, ඔහු විසින් ආයතනයට විධිමත් අයුරින් බඳවා ගනු ලබන නිලධරයන්ට පත්වීම් ලිපි නිකුත් කළ යුතු වන්නේය. එසේ නොවන පත්වීම් බල රහිත වන්නේය. ඒ අනුව, සභාපතිවරයා විසින් සිය ධූරය සතු බලය අභිබවා කටයුතු කර ඇති අතර එසේ පත්වීම් ලබාදීම පිළිබඳව ඊට පසුව හෝ කළමනාකරණ මණ්ඩලය දැනුවත් කිරීමට කටයුතු කර නොමැත.

6. හිටපු සභාපතිවරයා විසින් විධිමත් ක්‍රියා පටිපාටියෙන් බැහැරව තම බලය අයුතු ලෙස යොදා ගනිමින් සිදු කරන ලද මෙම අත්තනෝමතික ක්‍රියාව හේතුවෙන් මහා භාණ්ඩාගාරයේ වැටුප් ගෙවීමේ හැකියාව මෙම නිලධරයන්ට නොලැබී ඇති අතර, ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය විසින් උපයනු ලබන ආදායමින් මෙම නිලධරයන්ගේ වැටුප් පාරිශ්‍රමික ගෙවීම සිදු කරනු ලැබ ඇත. ඒ අනුව, 2020 වර්ෂයේ සිට ආයතනය විසින් උපයනු ලබන ආදායම මඟින් මෙම නිලධාරීන් සඳහා වැටුප්, EPF, ETF සහ අනෙකුත් දීමනා ගෙවා ඇති නමුත් රජය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ විධිවිධානයන්ට අනුව අනුමත සේවක සංඛ්‍යාව සඳහා පමණක් ගෙවීමට නියෝග කර ඇති දීමනා සහ අනෙකුත් සහන මෙම නිලධාරීන්ට ලබාදීමට කටයුතු කර නොමැත.

7. 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනතේ විධිවිධානයන්ට පටහැනිව මෙම පැමිණිලිකරුවන් සිව්දෙනාට ස්ථිර පත්වීම් ලිපි ප්‍රදානය කර ඇති පසුබිමක, එවකට ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරට අදාළ රාජකාරී පවරා මෙම පැමිණිලිකරුවන් සේවයේ යෙදවීමට කටයුතු කර ඇත. තවද ආයතනයේ සභාපතිවරයාගේ අත්සනෙන් යුතුව ස්ථිර පත්වීම් ලිපි ලබාදීමේදී එම ක්‍රියාපටිපාටිය විධිමත් නොවන බවට මෙම පැමිණිලිකරුවන් හට වැටහීමක් තිබී නොමැති අතර, එලෙස පත්වීම් ලිපි ලබාදීමෙන් අනතුරුව වසර කිහිපයක් ඔවුන්ගේ සේවය ලබා ගැනීමටද ආයතනය කටයුතු කර ඇත.

8. 2020 වර්ෂයේ සිට අවිධිමත්ව බඳවා ගනු ලැබූ මෙම නිලධරයන් සිව්දෙනා ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයට සිය දැනුම සහ කුසලතාවය උපරිම අයුරින් ලබා දී ඇති බවත්, එම තනතුරු සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇති බවත්, සමස්ථ රාජ්‍ය අංශයේ නිලධරයන්ට ද්විභාෂා ප්‍රවීණතාවය ලබාදීම සඳහා සිංහල සහ දෙමළ භාෂා පුහුණු පාඨමාලා පැවැත්වීම, සම්බන්ධීකරණය කිරීම, පාඨමාලා විෂය නිර්දේශ සංවර්ධනය කිරීම මෙන්ම ඉංග්‍රීසි හා විදේශ භාෂා ඉගැන්වීම සඳහා පාඨමාලා පැවැත්වීම වැනි පුළුල් වැඩ කොටසක් සිදුකිරීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය වෙත වගකීම් පැවරී ඇති නමුත් ඒ සඳහා ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නොමැති වීම විශාල ගැටළුවක්ව තිබියදී එම මානව සම්පත් හිඟය යම්තාක් දුරට හෝ සමනය කර ගැනීමට මෙම අවිධිමත්ව බඳවා ගන්නා ලද නිලධරයන් 04දෙනාගෙන් ලැබෙන දායකත්වය අතිමහත් වන බවත් වගඋත්තර පාර්ශවය විසින් වැඩිදුරටත් දක්වා ඇත.

9. එමෙන්ම ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කර ඇති සේවක සංඛ්‍යාව 41 දෙනෙකි. එම අනුමත සේවක සංඛ්‍යාවෙන් දැනට නිත්‍ය තනතුරුවල සේවයේ රැඳී සිටිනුයේ 34 දෙනෙක් වන බැවින් සේවක පුරප්පාඩු 07 ක් දැනට පවතින බවට වගඋත්තර පාර්ශවය විසින් ලිඛිත වාර්තා මඟින් කරුණු ඉදිරිපත් කර ඇත.

<u>නිගමනය:</u>

2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනතේ විධිවිධානයන්ට පටහැනිව සභාපතිවරයාගේ අත්සනෙන් යුතුව මෙම පැමිණිලිකරුවන් සිව්දෙනාට ස්ථිර පත්වීම් ලිපි ප්‍රදානය කර ඇති නමුත් එම ක්‍රියාපටිපාටිය විධිමත් නොවන බවට මෙම පැමිණිලිකරුවන් හට වැටහීමක් තිබී නොමැත. කෙසේ නමුත්, එවකට ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරට අදාළ රාජකාරී පවරා මෙම පැමිණිලිකරුවන් සිව්දෙනා වසර කිහිපයක් සේවයේ යෙදවීමට කටයුතු කර ඇති බැවින් අධ්‍යක්ෂ ජනරාල්වරයා අදාළ පත්වීම් අනියමින් පිළිගෙන ඇති බවට නිරීක්ෂණය වේ.

එමෙන්ම අදාළ ස්ථිර පත්වීම් ලිපි සභාපතිවරයාගේ අත්සනෙන් යුතුව නිකුත් කර ඇති නමුත් එම පත්වීම් ලිපි ලබා දීමෙන් අනතුරුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රාජකාරී පවරා මෙම පැමිණිලිකරුවන් සිව්දෙනා සේවයේ යොදවා තිබීම හේතුවෙන් රැකියාවේ සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් පැමිණිලිකරුවන් හට නීත්‍යානුකූල අපේක්ෂාවක් ඇති වී තිබෙන බවට නිරීක්ෂණය වේ.

කරුණු එසේ හෙයින්, වගඋත්තර පාර්ශවයේ ක්‍රියාකලාපය තුළින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කර ඇති නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද, නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන අයිතිවාසිකම සහ 14(1)(උ) ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කර ඇති නීත්‍යානුකූල රැකියාවක නියුක්ත වීමේ නිදහස සඳහා හිමිකම ඇත්තේය යන අයිතිවාසිකම මෙම පැමිණිලිකරුවන් සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.

I. මෙම පැමිණිලිකරුවන් සිව්දෙනා තනතුරට අදාළ සුදුසුකම් සපුරා ඇති බැවින් ද, ඔවුන් ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ දැනටමත් වසර 5කට වැඩි කාලයක් අඛණ්ඩව සේවය කර ඇති බැවින් ද, ඔවුන්ගේ සේවය ප්‍රශස්ත මට්ටමක පවතින බව එකී ආයතනය විසින්ම තහවුරු කර ඇති බැවින් ද, වර්තමානය වන විට ආයතනය තුළ පවතින සේවක පුරප්පාඩු සම්බන්ධයෙන් සැලකිල්ලට ගනිමින් එකී පුරප්පාඩු සඳහා මෙම පැමිණිලිකරුවන් බඳවා ගැනීමට වගඋත්තර පාර්ශවය විසින් සුදුසු පියවර ගත යුතුය.

2026. ০৬ - ০৭ දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ අදාළ නිර්දේශය ක්‍රියාත්මක කර තිබේද නැද්ද යන්න පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු,
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් -: (01) අමාත්‍යතුමා, - කාරුණික දැනගැනීම සඳහා

අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය,

අංක 19, ශ්‍රී සංඝරාජ මාවත,

කොළඹ 10.

(02) ලේකම්, - කාරුණික දැනගැනීම සඳහා

අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය,

අංක 19, ශ්‍රී සංඝරාජ මාවත,

කොළඹ 10.